**ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය - 2021**

**--------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 **මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූල නොවීම**

| | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ගෙන් විදුලිබලය උත්පාදනය කිරීමේ ව්‍යාපෘති සඳහා අධිකාරියට ලැබී තිබුණු රු. මිලියන 51.3 ක බලපත්‍ර ආදායම ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 10 අගය හුවමාරු ගණුදෙනු වලින් පැනනගින අයභාර ප්‍රකාරව බලපත්‍ර කාලපරිච්ඡේදය පුරා කාලීනව ආදායමට හඳුනා නොගෙන සමාලෝචිත වර්ෂයේ බලශක්ති බලපත්‍ර ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | අප ආයතනය මගින් බලපත්‍ර ලාභියාට වාර්ෂිකව අනිවාර්ය සේවාවක් සැපයීම සඳහා බැදීමක් නොපවතී. මෙහි දී බොහෝ විට සිදු වන්නේ අධීක්ෂණය කිරීමක් මිස සේවා සැපයීමක් නොවේ. එබැවින් මෙහි දී අධිකාරිය මඟින් භාවිතා කරනු ලබන්නේ ශ්‍රී ලංකා රජයට අයිති සම්පතක් උපයෝජනය කිරීම සඳහා අවස්ථාව ලබා දීමයි. එම නිසා මෙය ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කාර ප්‍රමිත අංක 10 හි 20 වන වගන්තිය අනුව සේවා ඉටුකිරීමේ අදියර වශයෙන් හඳුනාගත නොහැකි බැවින් එම වගන්තිය ප්‍රකාරව ගිණුම්ගත කළ නොහැකි බව අපගේ හැඟීමයි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 10 ප්‍රකාරව බලපත්‍ර ආදායම බලපත්‍ර කාලපරිච්ඡේදය පුරා කාලීනව ආදායම් ලෙස ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | ඉඳුරාන සරත්චන්ද්‍ර රාජකරුණා අනුස්මරණ ජාත්‍යන්තර මධ්‍යස්ථානය සඳහා 2017 වර්ෂයේදී පරිත්‍යාග වශයෙන් ලද ඉඩම ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 25 හි 7 ඡේදය ප්‍රකාරව අත්පත් කරගත් දිනට පැවති සාධාරණ වටිනාකම මත අගය කර ගිණුම්ගත කර නොතිබුණි. | 2017 වර්ෂයේ දී පරිත්‍යාග වශයෙන් ලද ඉඳුරාන ඉඩම තක්සේරු කිරීම සඳහා 2018 වර්ෂයේ සිටම රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව සමඟ කටයුතු කරන ලද අතර, තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් තක්සේරු වාර්තාව ඉදිරිපත් තරන ලද්දේ 2022 වර්ෂයේ දීය. එබැවින් මෙය 2022 වර්ෂයේ දී ගිණුම්වල ප්‍රකාශ වේ. | ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2021 දෙසැම්බර් 31 දිනට පොත්වල අගය ශුන්‍ය වූ පිරිවැය රු. මිලියන 355 ක් වූ ස්ථාවර වත්කම් තවදුරටත් භාවිතා කරමින් පැවති අතර, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 65 ඡේදය ප්‍රකාරව එම වත්කම්වල ඵලදායි ජීවිතකාලය වාර්ෂිකව සමාලෝචනය කර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | 2020 හා 2021 වර්ෂයන් වලදී ශ්‍රී ලංකාවට බලපෑ Covid – 19 ව්‍යසනය හේතුවෙන් ආයතනයේ භෞතිකව පවතින ස්ථාවර වත්කම් හඳුනාගැනීම සිදු කළ නොහැකි විය. 2023 වර්ෂයේ සිට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ට අදාලව තොරතුරු ඉදිරිපත් කිරීමට අප අධිකාරියට හැකි වේ. | - එම - |
| (ඈ) | 2021 දෙසැම්බර් 31 දිනට පැවති අක්‍රීය උපකරණ අයිතම 263 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 ප්‍රකාරව හෙළිදරව් කර නොතිබුණි. | මෙයද ඉහත විස්තර කළ පරිදි එක් එක් වත්කමෙහි ධාරණ අගය පැහැදිලිව හඳුනාගැනීමට අපහසු වීම මත ඇති වී තිබෙන තත්ත්වයකි. මෙය ද 2023 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන වල නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලදි. | -එම- |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉදිකිරීම, හිමිකාරීත්වය සහ ක්‍රියාත්මක කිරීමේ පදනම ( BOO ) මත පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ගෙන් විදුලිබලය උත්පාදනය හා සැපයීම සඳහා යෝජනා කැඳවීමේදී අධිකාරිය වෙත සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු රු. මිලියන 23 ක් වූ ආපසු නොගෙවන තැන්පතු මුදල් ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | රු.මිලියන 23 ට අදාල තැන්පතු සඳහා තැන්පත් කරුවන් විසින් නිසිපරිදි තොරතුරු ලබා නොදීම මත හඳුනාගැනීමට නොහැකිව පැවතුණි. එබැවින් 2022 වර්ෂයේ දී ඒවා ආදායම් ලෙස හඳුනාගැනීමට කටයුතු කිරීමට බලාපොරොත්තු වේ. | වාර්ෂික ආදායම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට හැකිවන පරිදි ගිණුම්කරන පද්ධතිය සකස් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2021 දෙසැම්බර් 31 වන විට අධිකාරියට ලැබී නොතිබුණු රු.මිලියන 2.5 ක විද්‍යුත් උපකරණ 2 ක් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | මෙය 2021 වර්ෂයේ ගිණුම් පොත් තැබීමේ දී සිදු වූ සටහන් කරන දෝෂයක් වන අතර 2022 වර්ෂයේ දී නිවැරදි කරනු ලැබ ඇත. | ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ආපසු ගෙවිය යුතු රු. 195,000 ක බදු අත්තිකාරම් මුදලක් වගකීම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | රජයේ විගණන අංශයේ උපදෙස් පරිදි 2022 මූල්‍ය ප්‍රකාශන වලදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | -එම- |

## 1.6 නීතිරීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මුදල් රෙගුලාසි 137 හා 392(ඇ) | අධිකාරිය විසින් සැපයුම් සම්පූර්ණ වීමට පෙර වියදම් අනුමත කර 2021 දෙසැම්බර් මස රු.මිලියන 79 ක වටිනාකමැති චෙක්පත් 12 ක් ලියා අත රඳවාගෙන තිබුණි. ඉන් රු.මිලියන 61.8 ක් වූ චෙක්පත් 5 ක් පසුව අවලංගු කර තිබුණද මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | 2022 වර්ෂය සඳහා ප්‍රාග්ධන වියදම් ලෙස අනුමත වී තිබුනේ මිලියන 50 පමණක් වීමය. මෙහිදී 2021 වර්ෂය වෙනුවෙන් වෙන්කරන ලද ප්‍රාග්ධන ප්‍රතිපාදන වලින් මිලියන 78.9 ක ප්‍රතිපාදන 2022 වර්ෂයේදී ලබාදෙන ලෙස ප්‍රතිපාදන (Allocation) දෙන මෙන් ජාතික අය වැය දෙපාර්තමේන්තුව සමඟ සාකච්ජා කළ ද, රටෙහි පැවති දැඩි ආර්ථික අර්බුදය නිසා 2022 වර්ෂය සඳහා වෙනත් ප්‍රතිපාදන වෙන් කිරීම කළ නොහැකි බව වාචිකව දන්වන ලදි. එබැවින් අදාල වැඩ හා සැපයුම් නිසි පරිදි සම්පූර්ණ වීමෙන් අනතුරුව සැපයුම්කරුවන්ට චෙක්පත් ලබාදෙන ලදී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි 502(2) | පිරිවැය රු. මිලයන 1,008 ක් වූ ස්ථාවර වත්කම් වෙනුවෙන් 11 වැනි පරිශිෂ්ටයෙහි පරිදි ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලද අතර එය යාවත්කාලීන කරමින් පවතී. මෙය 2023 වර්ෂයේ මැයි මස අවසන් වන විට සම්පූර්ණ කිරීමට බලාපොරොත්තු වේ. | -එම- |
| (iii) | මුදල් රෙගුලාසි 454, 715(2),715(3), 752 සහ 753 | අධිකාරියේ ඉන්වෙන්ට්‍රි උපකරණවල ආරක්ෂාව තහවුරු වන ආකාරයෙන් බඩු වට්ටෝරු පොත් පවත්වාගෙන යාම, උපකරණවල භාරය සම්බන්ධයෙන් වගකිවයුතු නිළධාරීන් පත්කිරීම,විධිමත් අනුමැතියක් සහිතව භාණ්ඩ නිකුත්කිරීම සහ භාණ්ඩ | මුදල් රෙගුලාසි 715(12) ප්‍රකාරව භාණ්ඩ ස්වකීය පෞද්ගලික භාරයේ තබාගැනීම හා වගකීම් දැරීම සඳහා නිලධාරීන් පත්කර ඇති අතර 2022 වර්ෂයේ සිට මෙම ක්‍රියාවලීන් මූල්‍ය රෙගුලාසි අනුව සිදුවනු ඇත. | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| | | ලැබීම් සහ නිකුත්කිරීම් සඳහා විධිමත් වාර්තා පවත්වාගෙන යාම සිදුකර නොතිබුණි. | | |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 15:1 (ix) වගන්තිය. | අධිකාරිය පිහිටවූ 2007 වර්ෂයේ සිට අධිකාරියේ නිළධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩ ඉම් විභාග නොපවත්වා නිළධාරීන් සඳහා වැටුප් වර්ධක ලබා දී තිබුණි. | කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීමට අවශ්‍ය කටයුතු සූදානම් කොට ඇත. ශ්‍රී ලංකා පරිපාලන සංවර්ධන ආයතනය (SLIDA) විසින් පැවැත්වීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදුකර ඇත. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2019 මාර්තු 28 දිනැති අංක PS/PCMD/C/13/2019 දරන ජනාධිපති කාර්යාල චක්‍රලේඛයේ (අ) සහ (ආ) වගන්ති | අධිකාරියේ බලශක්ති කාර්යක්ෂමතාවය සහ සංරක්ෂණය සඳහා පත්කල යුතු බලශක්ති කළමනාකරු සහ බලශක්ති සංරක්ෂණ කමිටුව පත්කර නොතිබුණු අතර අධිකාරිය විසින් සියළුම රාජ්‍ය ආයතන නියාමනය කර ප්‍රගතිය සමාලෝචනය කළ යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි. | 2023 වසරේ මුල් භාගයේ දී මෙම කටයුත්තට වැඩිමනත්ව සියළු රාජ්‍ය ආයතන අරඹයා බලශක්ති සංරක්ෂණ වැඩපිළිවෙලක් නිර්මාණය කොට ඒ සඳහා අමාත්‍යාංශ අනුමැතිය අපේක්ෂා කොට ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2020 ඔක්තෝබර් 02 දිනැති අංක 05/2020 දරන වත්කම් කළමනාකරණ චක්‍ර ලේඛය | වාහන අපහරණයෙන් ලැබෙන සියළුම ආදායම් නියමිත පරිදි ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වුවත් අධිකාරිය විසින් 2019 සහ 2021 වර්ෂවල වාහන අපහරණයෙන් උපයා තිබුණු රු. මිලියන 3.8 ක් එසේ බැර කර නොතිබුණි. | ආයතනය විසින් අපහරණය කරන ලද වාහන පිළිබඳව තොරතුරු මුදල් අමාත්‍යාංශයේ Comptroller General officer වෙත තොරතුරු වාර්තා කරන ලද අතර, විගණනයේ නිරීක්ෂණ සම්බන්ධයෙන් ඔවුන් දැනුවත් කර ඔවුන්ගේ උපදෙස් පරිදි කටයුතු කිරීමට බලාපොරොත්තු වෙමු. | -එම- |
| (ඉ) | 2019 දෙසැම්බර් 17 දිනැති අංක 08/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | 2020 ජනවාරි 31 දිනට ප්‍රථම විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන පද්ධතිය සමඟ ලියාපදිංචි විය යුතු වුවත් 2022 දෙසැම්බර් 31 වන විටත් අධිකාරිය එම පද්ධතිය සමඟ ලියාපදිංචි වී නොතිබුණි. | විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය සමඟ ලියාපදිංචි වීමට අවශය පියවරයන් මේ වන විට ආරම්භ කර ඇත. | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| (ඊ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය. | 2021 වර්ෂයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව 2022 මාර්තු 31 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, අධිකාරියේ 2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව, 2023 ජනවාරි වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මේ වනවිට නිමකර ඇති අතර විගණන හා කළමනාකරණ කමිටුවේ අනුමැතිය ලබාගැනීමෙන් අනතුරුව විගණනය සඳහා ඉදිරිපත්කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. | -එම- |
| (උ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 ඡේදය | මුදල් වර්ෂය ආරම්භවීමට දින 15 කට පෙර ඉදිරි වර්ෂ 3 සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිත යාවත්කාලීන කරන ලද සංයුක්ත සැලැස්මේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2022 – 2025 කාලපරිච්ඡේද සඳහා වූ සංයුක්ත සැලැස්ම විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ඇත. | -එම- |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 158 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. මිලියන 43 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. මිලියන 115 ක වර්ධනයක් නිරීක්ෂණය විය. භාණ්ඩාගාර ප්‍රතිපාදන හා බලශක්ති බලපත්‍ර ආදායම් පිළිවෙලින් රු. මිලියන 49 ක් සහ රු.මිලියන 25 කින් වැඩිවීම සහ පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා අභිප්‍රාය කැඳවීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 28 ක තැන්පතු මුදල් ලැබීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගණුදෙනු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරිය සතු වාහන අධීක්ෂණය කිරිම සඳහා මෙහෙයුම් පද්ධතියක් ස්ථාපනය කිරීමේ අරමුණින් රු.126,000 ක් වටිනා ජංගම දුරකථන 08 ක් 2020 දෙසැම්බර් 16 දින මිලට ගෙන තිබුණද 2023 ජනවාරි 23 වන විටත් එම පද්ධතිය ස්ථාපනය කිරීමට කටයුතු කර නොතිබුණු අතර එම දුරකථන අදාල කාර්යය සඳහා භාවිතා නොකර ඉන් දුරකථන 6 ක් අධිකාරියේ සේවකයන් වෙත අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව ලබා දී තිබුණි. අදාල ජංගම දුරකථන නිළධාරීන් වෙත විධිමත්ව නිකුත්කර ඉන්වෙන්ට්‍රිගත කර නොතිබුණි. | වාහන අධීක්ෂණය කිරීමේ මෙහෙයුම් පද්ධතිය ස්ථාපනය කිරිම සඳහා 2023 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් කර ඇත.2020 දෙසැම්බර් මස මිල දී ගත් දුරකතන ආයතනයේ බාහිර පාර්ශවයන් සමහ සම්බන්ධතා නිරතුරුව පවත්වා ගතයුතු නිලධාරීන් වෙත ලබාදීමට පසුගිය වසරේ නිවසේ සිට රාජකාරි කටයුතු කිරීමට සිදු වූ කාලයේ කළමණාකරනය තීරණය කර ඇත.තවදුරටත් බාහිර පාර්ශවයන් සමහ කටයුතු කරන එම නිලධාරීන් වෙත මෙම දුරකථන පහසුකම් ලබාදී ඇත. | වත්කම් මිළදී ගැනීම නිවැරදි අවස්ථාවේදී සිදුකළ යුතු අතර ඒවා අපේක්ෂිත කාර්යය සඳහා භාවිතා කළ යුතුය. |
| (ආ) | 2007-2009 වර්ෂවල විදුලි වාහන 3 ක් නිෂ්පාදනය සඳහා අධිකාරිය විසින් පුද්ගලික සමාගමක් වෙත රු.මිලියන 7.8 ක මුදලක් ලබා දී තිබුණි. 2012 දෙසැම්බර් 7 දින පැවති පොදු ව්‍යාපාර කාරක සභාවට මේ සම්බන්ධව අධිකාරිය විසින් වැරදි තොරතුරු ලබාදී තිබුණු අතර මෙම කාර්යයට සම්බන්ධ නිළධාරීන්ට විරුද්ධව විනය ක්‍රියාමාර්ග ගැනීමටත්, මේ සම්බන්ධ සත්‍ය තත්ත්වය ප්‍රධාන ගණන්දීමේ නිළධාරි මඟින් පොදු ව්‍යාපාර කාරක සභාව වෙත දැනුම් දීමටත් කමිටු නියෝගය ප්‍රකාරව විගණකාධිපතිගේ ප්‍රධානත්වයෙන් 2013 ජනවාරි 4 දින පැවති කමිටු රැස්වීමේදී තීරණය කර තිබුණි. කෙසේ නමුත් මීට සම්බන්ධ නිළධාරීන්ට විරුද්ධව කිසිදු විනය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණු අතර 2023 ජනවාරි වන විටත් අදාල කාර්යය සිදුකර නොතිබුණි. | මෙම ව්‍යාපෘතිය පිළිබඳ ගැටළුව ජාතික බේරුම්කාරක සභාව (National Arbitration Council) වෙත යොමු කරන ලදුව එහිදී ඇති වූ සාකච්ඡා මත පදනම්ව විදුලි රථ තාක්ෂණය ප්‍රවර්ධනය කිරීමේ මෙවලමක් ලෙස එක් ආකෘතියක් අධිකාරිය වෙත ලබා ගැනීමෙන් මෙම ගැටළුව විසඳා ගැනීමට මණ්ඩලය විසින් 2022.11.21 දින තීරණය කොට ඇත. | කමිටු නියෝග ප්‍රකාරව කටයුතු කර අනාර්ථික වියදම් දැරීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකළ යුතුය. |
| (ඇ) | අධිකාරිය විසින් ප්‍රධාන කාර්යාලය සඳහා බලශක්ති කාර්යක්ෂමතාවය සහිත ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3 මාර්ගෝපදේශය ප්‍රකාරව මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර ඒ සඳහා වන අධිකාරී බලය සහිත ප්‍රසම්පාදන කමිටුවක අනුමැතිය ලබාගැනීමකින් තොරව ගොඩනැගිල්ලේ නිර්මාණ සැලසුම් වෙනුවෙන් 2020 වර්ෂය දක්වා රු.මිලියන 23.3 ක් වැයකර තිබුණි. තවද | රජයේ විදුලිය කපා හැරීම සහ මේ සම්බන්ධයෙන් අය වැය ප්‍රතිපාදන වෙන් කර දීමට මුදල් අමාත්‍යාංශය එකඟ නොවීම මත තව දුරටත් මෙම කටයුත්ත ඉදිරියට ගනයා නොහැකි තත්ත්වයක් උද්ගත වී ඇත. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු අතර අනාර්ථික වියදම් දැරීම සම්බන්ධයෙන් විධිමත් |

| | |
|---|---|
| මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් සඳහා 2023 ජනවාරි දක්වා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී නොතිබුණු අතර ඒ හේතුවෙන් ඉදිකිරීම් කටයුතු ආරම්භකිරීමට නොහැකි වී තිබුණි.ඒ අනුව උක්ත වියදම අනාර්ථික වියදමක් බවට පත් වී තිබුණි. | පරීක්ෂණයක් සිදුකළ යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරි පනතේ 46 (2) (ඇ) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකාවේ අංගාර වත්කම් කළමනාකරණය කිරීම සඳහා සංවර්ධනකරුවන්ගෙන් ගාස්තු අයකර ගත හැකි වුවත් පනතට අවශ්‍ය සංශෝධනයන් සිදුකර අදාල ගාස්තු අයකරගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම වගන්තිය යටතේ එවැන්නක් සඳහා ප්‍රතිපාදන සපයා නොමැත. | පනත සඳහා අවශ්‍ය සංශෝධනයන් සිදුකර අදාල ගාස්තු අයකළ යුතුය. |
| (ආ) | 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරි පනතේ 58 වගන්තිය ප්‍රකාරව විෂයභාර අමාත්‍යවරයා විසින් 2016 මාර්තු 4 දිනැති අංක PE/TECH/D/06/01 දරන චක්‍රලේඛය මඟින් අධිකාරියේ සභාපති වෙත නිකුත්කර තිබුණු පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සංවර්ධනය කඩිනම්කිරීමේ විධාන අධිකාරිය විසින් නිසිපරිදි බලාත්මක කර නොතිබුණි. එම චක්‍රලේඛයේ 16 වගන්තියට අනුව ව්‍යාපෘති කමිටුව විසින් නිර්දේශ නොකරන ලද ව්‍යාපෘති සංවර්ධනය කිරීම සඳහා විශේෂ වැඩපිළිවෙලක් කළමනාකරණ මණ්ඩලය විසින් සකස් කර නොතිබුණු අතර 17 වගන්තිය අනුව විශේෂ බලපත්‍ර කාලය අවසන් කුඩා ජල විදුලි ව්‍යාපෘතිවල ස්ථාන පනතේ 30(1) වගන්තියේ බලතල ප්‍රකාරව රජයට පවරාගෙන විවෘත ලංසු කැඳවීම මඟින් සුදුසු ආයෝජකයන් තෝරා සංවර්ධනය කිරීම සඳහා විදුලි බල මණ්ඩලය හා ඒකාබද්ධව පියවර ගත යුතු වුවත් එවැනි කුඩා ජල විදුලි ව්‍යාපෘති 30 කට අදාලව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති කඩිනම් කිරීම මේ වනවිටත් ආරම්භකර ඇති අතර, උපදේශක කමිටු නිර්දේශ හරහා එම ව්‍යාපෘති සඳහා බලශක්ති බලපත්‍ර දිගු ලබාදී ඇත. | පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සංවර්ධනය කඩිනම් කිරීම සඳහා අධිකාරියට පවරා තිබූ කාර්යයන් කාර්යක්ෂමව ඉටුකළ යුතුය. |
| (ඇ) | 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරි පනතේ 19 (1) වගන්තිය යටතේ මධ්‍යම ජාලය තුල වූ පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති වෙනුවෙන් වාර්ෂිකව රාජ්‍ය භාගයක් අයකල හැකි වුවත් ඒ සඳහා අවශ්‍ය රෙගුලාසි සකස්කර අදාල ගාස්තු අයකිරීමට කටයුතු කර නොතිබුණි. | අවස්ථා කිහිපයකදීම විවිධ ඇමතිවරු අමාත්‍යධුරය හොබවන අවස්ථාවලදී මේ පිළිබඳ කැබිනට් මණ්ඩලයේ අනුමැතිය පතා කැබිනට් පත්‍රිකා පිළියෙළ කොට අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කොට ඇතත් එම උත්සාහයන් නිෂ්ඵල | පනතේ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | විය. එසේ වූයේ එවැනි රාජ්‍ය භාගයන් අය කිරීමෙන් විදුලි බිල තවත් වැඩිවේ යැයි අමාත්‍යාංශය සහ එකී ඇමතිවරුන් දැරූ මත නිසාය. | |
| (ඈ) | 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරි පනතේ 45 වගන්තිය ප්‍රකාරව මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව පාශානිභූත ඉන්ධන නිෂ්පාදන ආනයනය මත සෙස් බද්දක් පැනවීම සිදුකල යුතු වුවත් අධිකාරිය පිහිටුවා වසර 15 ක් ගත වී තිබුණද ඊට අදාල රෙගුලාසි සකස් කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඉ) | 1994 ජුනි 04 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සහ 2000 ජනවාරි 11 දිනැති අංක PF/PE/5 දරන රාජ්‍ය මුදල් චක්රලේඛයට පටහැනිව විදේශ ව්‍යාපෘතියක් යටතේ අධිකාරිය වෙත ලැබී තිබුණු මුදල්වලින් 2010 සහ 2011 වර්ෂවලදී අධිකාරියේ සේවකයන්ට ගෙවන ලද රු. මිලියන 3 ක වෘත්තීය දීමනාව නැවත අයකර ගත යුතු ලෙස විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්ගේ 2012 දෙසැම්බර් 03 දිනැති අංක PE/IA/22/VOL.II දරන ලිපියෙන් අධිකාරියේ සභාපති වෙත නියෝග කර තිබුණද 2023 ජනවාරි වන විටත් අදාල මුදල් අයකර නොතිබුණි. | Switch Asia ව්‍යාපෘතිය යටතේ අධිකාරිය වෙත ලැබුණු මුදලින් 2010 සහ 2011 වර්ෂවල දී අධිකාරියේ සේවකයන්ට ගෙවන ලද රු.3,135,202.00 වෘත්තීය දීමනාව අමාත්‍යාංශ ලේකම්තුමාගේ උපදෙස් පරිදි නැවත අයකර ගැනීමටත් එම වැඩසටහන වෙනුවෙන් නිශ්චිතව යෙදුණු නිලධාරීන්ට රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්තුමාගේ 2021/07/27 දිනැති අංක: SMRC/FIN/SLSEA/2021 ප්‍රකාරව ලබාදීමටත් කටයුතු කරමි. | චක්‍ර ලේඛ විධිවිධානවලට පටහැනිව ගෙවීම් කර ඇති දීමනා නැවත අයකර ගත යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනතේ 8 වගන්තිය අනුව එක් එක් ප්‍රදේශවල පුනර්ජනනීය බලශක්ති සම්පත් විභවතාවය අනුව පුනර්ජනනීය බලශක්ති සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත ගැසට් පත්‍රයේ පල කළ යුතු වුවත් අධිකාරිය පිහිටුවා වසර 15 ක් ගත වී තිබුණද 2023 ජනවාරි වන විටත් එවැනි සැලැස්මක් ගැසට් කර නොතිබුණි. ඒ හේතුවෙන් බලශක්ති සංවර්ධන ප්‍රදේශවල පුනර්ජනනීය බලශක්ති සම්පත් සංවර්ධන කාර්යයන් ඉතා මන්දගාමී වී තිබුණි. අධිකාරිය විසින් විවිධ දිස්ත්‍රික්කවල හෙක්ටයාර් 269,562 ක් සුළං බලශක්ති සංවර්ධන ප්‍රදේශ ලෙස ගැසට් කර තිබුණද 2021 දෙසැම්බර් 31 වන විට ඉන් හෙක්ටයාර් 206 ක භූමි ප්‍රමාණයක පමණක් පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතිවල මූලික සංවර්ධන කාර්යයන් ආරම්භකර තිබුණි | ප්‍රමාණවත් මානව සම්පතක් නොතිබූ අතර 2020 වසර තුලදී පනතෙහි 8 වන වගන්තිය අනුව පුනර්ජනනීය බලශක්ති සැලස්ම සකස් කරන ලද අතර, 2021 ජුලි 21 වන දින මහජන අදහස් ලබා ගැනීම සඳහා ප්‍රකාශයට පත් කරන ලදී. මහජන අදහස් අනුව සම්පූර්ණ කරන ලද පුනර්ජනනීය සංවර්ධන සැලස්ම භාෂා ත්‍රිත්වයෙන් 2021 නොවැම්බර් 26 වන දින ලේකම්, සූර්යබල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය වෙත ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීමට අවශ්‍ය අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී. අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සඳහා පසු විපරම් සිදු කරමින් පවතින අතර, අනුමැතිය ලද වහාම ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීමට නියමිතය. | පනතේ විධි විධාන ප්‍රකාරව පුනර්ජනනීය බලශක්ති සංවර්ධන සැළැස්ම ගැසට් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ලංකා විදුලි බල මණ්ඩලයේ මධ්‍යම ජාලයේ පවතින ධාරිතාවය (Available Grid Capacity) ප්‍රමාණවත් නොවීමේ ගැටළුවට විසඳුම් ලෙස අධිකාරිය විසින් 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරි පනතේ 5 (ඇ) වගන්තිය ප්‍රකාරව මධ්‍යම ජාලයෙන් බැහැර වූ (off grid) පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති දිරිමත් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සිදුකල යුතු වුවත් අධිකාරිය විසින් ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. මේ හේතුවෙන් පනතේ 25 (අ) වගන්තිය ප්‍රකාරව 2023 ජනවාරි වන විටත් මධ්‍යම ජාලයෙන් බැහැර කිසිදු පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතියක් | ප්‍රධාන ජාලයෙන් බැහැරව සිදුකරන පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා අවසර ඉල්ලීම් ලැබී නොමැත.එවැනි ඉල්ලීම ඉදිරිපත් වුවහොත් සහ අවශ්‍ය කොන්දේසි සපුරා ඇතිනම් අවසර පත් නිකුත් කල හැකිය. | පනතේ විධි විධාන ප්‍රකාරව පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති දිරිමත් කිරීම හා ප්‍රවර්ධනය කිරීම සිදුකල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සඳහා බලශක්ති බලපත්‍ර නිකුත් කිරීමට හැකි වී නොතිබුණි. | | |
| (ඇ) | 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරි පනතේ 47(1) වගන්තිය අනුව, බලශක්ති කාර්යක්ෂමතාවට අදාළ යම් ව්‍යාපෘතියක් පවත්වාගෙන යාම සඳහා ණය ඉල්ලුම් කරන ආයෝජකයන් වෙනුවෙන් ඇප ලබා දීමේ කාර්යය සඳහා සුනිත්‍ය බලශක්ති ඇප අරමුදල පිහිටුවා තිබුණද එම අරමුණු ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය කාර්යයන් මේ දක්වා ඉටු කර නොතිබුණි. | සුනිත්‍ය බලශක්ති ඇප අරමුදල ස්ථාපිත කොට එම අරමුදලේ අරමුණු ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය රෙගුලාසි හා මාර්ගෝපදේශ සැකසීම් කටයුතු සිදුකරනු ලබන අතර, ඉතා ඉක්මනින් එම මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2007අංක35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරි පනතේ 30 වගන්තිය යටතේ හෙක්ටයාර් 2.45 ක් වූ ඉඩම් කැබලි 45 ක් අධිකාරිය විසින් අත්කරගෙන තිබුණද පනතේ 32 වගන්තිය ප්‍රකාරව එලෙස පවරාගත් ඉඩම් කට්ටි 29 ක් විධිමත්ව බදු දීම සිදු කර නොතිබුණි. 2020 දෙසැම්බර් වර්ෂයේ බදු දී තිබුණු ඉඩමක් වෙනුවෙන් අයවිය යුතු රු. 780,000 ක බදු මුදල් අයකර නොතිබුණි. | අධිකාරිය විසින් භුක්තිය භාර ගන්නා ලද ඉඩම් කැබලි 45 න් ඉඩම් කැබලි 16 ක් නිවැරදිව බදු දී ඇති අතර ඉතිරි ඉඩම් කැබලි 29 පනතේ 9 වැනි වගන්තිය යටතේ හිමිකම් පරීක්ෂණ අවසන් කිරීමෙන් පසුව රෙජිස්ටාර් කාර්යාලයේ ලියාපදිංචි කිරීමෙන් පසු හිඟ බදු මුදල් ද සමඟ නියමිත බදු මුදල් අය කිරීමට කටුයුතු කරන බව දන්වමි. | ඉඩම අත්පත් කරගත් පසු වහාම සංවර්ධනකරු වෙත විධිමත්ව භුක්තිය භාරදී එදින සිට බදු මුදල් අයකළ හැකි පරිදි සුදුසු ක්‍රමවේදයක් සකස් කළ යුතුය. |
| (ඉ) | 2019 අගෝස්තු 9 දිනැති අංක 2135/61 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශිත ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සහ උපායමාර්ග සංග්‍රහයේ අංක 4 හි සඳහන් කාලරාමුව යටතේ දක්වා තිබුණු ඉලක්ක සහ සංධිස්ථාන සහ ආයතනික වගකීම් අදාල වගකීම් පවරා තිබුණු ආයතන විසින් දෙවසරකට වරක් සමාලෝචනය කළ යුතු වුවත් අධිකාරිය වෙත නෛතිකව පවරා දී තිබුණු වගකිව යුතු කාර්යයන් 10 ක් සම්බන්ධයෙන් වන ප්‍රගතිය අධිකාරිය විසින් සමාලෝචනය කර නොතිබුණි. | මෙම සමාලෝචනය සිදු කිරීම සඳහා වගකීම් පැවරෙනුයේ ඒ සම්බන්ධයෙන් ස්ථාපනය කළ යුතු නියාමන කමිටුව විසිනි. ප්‍රතිපත්තිය ප්‍රකාශයට පත්වී වසර කිහිපයක් ගත වී තිබුණද ඒ පිළිබඳ බලශක්ති ක්ෂේත්‍රයේ ආයතනික රාමුව පෙළගැස්වීමක් මේ වන තුරු සිදුවී නොමැති අතර අධිකාරිය වෙනත් අරමුණු වෙනුවෙන් සිය ධාරිතාවය යොමු කොට ඇති හෙයින් මෙම ප්‍රතිපත්තියේ සඳහන් ඉලක්ක තවදුරටත් අදාල වන්නේ දැයි ගැටළු සහගත තත්ත්වයක් පැන නැගී ඇත. | ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සහ උපාය මාර්ග සංග්‍රහයේ අංක 4 ප්‍රකාරව අධිකාරිය විසින් ප්‍රගතිය සමාලෝචනය කල යුතුය. |

## 3.4 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2007 අංක 35 දරන ශ්‍රී ලංකා බලශක්ති අධිකාරි පනතේ 67 වගන්තිය ප්‍රකාරව විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා විසින් සාදනු ලැබ තිබුණු 2011 මැයි 10 දිනැති අංක 1705/22 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශිත නියෝග (රෙගුලාසි) අනුව මෙගාවොට් 700 ක ව්‍යාපෘතියක් සඳහා රු. මිලියන 35 ක අයදුම්පත් ගාස්තුවක් අයකළ යුතු වුවත් ඊට පටහැනිව රු. මිලියන 5 ක ගාස්තුවක් අයකරමින් ඉතිරි මුදල් පසුව අයකිරීමේ පදනමින් තාවකාලික අනුමැතිය ලබා දී තිබුණි. | විෂයභාර අමාත්‍යවරයාගේ අත්සනින්, 2022.03.22 දාතමින් මේ සඳහා අනුමැතිය ලැබී ඇත. | අනුමත රෙගුලාසි ප්‍රකාරව ගාස්තු අයකළ යුතුය. |

## 3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 මාර්ගෝපදේශය ප්‍රකාරව වැඩ නිමකිරීමට අපේක්ෂිත කාලයෙන් දින 28 ක් ඔබ්බට වලංගු වන සේ ඉදිකිරීම් කොන්ත්‍රාත් සඳහා කාර්යසාධන සුරක්ෂණයක් ලබාගත යුතු වුවත්, අධිකාරිය විසින් රු. මිලියන 21.6 ක් වටිනාකමැති කොන්ත්‍රාත්තු 6 ක් සඳහා වන කාර්යසාධන සුරක්ෂණ ඊට අනුකූලව ලබාගෙන නොතිබුණි. | මේ සම්බන්ධව කරුණු පරික්ෂාවක් සිදුකරමින් පවතින අතර ඒ සම්බන්ධව අවශ්‍ය පියවර ඉදිරියේදී සිදු කිරීමට නියමිතයි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | රු.මිලියන 1.6 ක් වැයකර තිබුණු 2019 වාර්ෂික වාර්තා මුද්‍රණ කටයුතු ගිවිසුම් ප්‍රකාරව අවසන් කළ යුතු දිනට දින 111 ක් ප්‍රමාද වී අවසන් කර තිබුණද, ප්‍රමාද ගාස්තු සම්බන්ධ කොන්දේසි ගිවිසුමට ඇතුලත් කර නොතිබීම හේතුවෙන් ප්‍රමාද ගාස්තු අයකරගැනීමට නොහැකි වී තිබුණි. | මේ සම්බන්ධව කරුණු පරික්ෂාවක් සිදුකරමින් පවතින අතර ඒ සම්බන්ධව අවශ්‍ය පියවර ඉදිරියේදී සිදු කිරීමට නියමිතයි. | ප්‍රසම්පාදන කටයුතු වලදී රජයට වියහැකි අලාභයන් අවම වන අයුරින් ගිවිසුම්ගත වීමට කටයුතු කළ යුතුය. |

## 3.6 වෙනත් සංවිධානවලට මුදාහළ සම්පත්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 ඡේදය ප්‍රකාරව රාජ්‍ය ව්‍යාපාරවල සම්පත් රේඛීය අමාත්‍යාංශයට හෝ රාජ්‍ය ආයතන වෙත ලබාදීම තහනම් වුවත් අධිකාරිය විසින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව රු. මිලියන 1.1 ක මුදලක් සහ රු. මිලියන 1.6 ක වටිනාකමැති විද්‍යුත් උපකරණයක් (smart interactive whiteboard) සහ පිරිවැය පිළිබඳ තොරතුරු නොමැති වත්කම් අයිතම 30 ක් විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති රාජ්‍ය අමාත්‍යාංශය වෙත ලබා දී තිබුණි. | 2021 වර්ෂයේ රාජ්‍ය අමාත්‍යාංශ සේවකයන්ගේ සේවක අතිකාල මුදල් අප්‍රේල් මස අලුත් අවුරුදු නිවාඩුවට පෙර ගෙවීමට මුදල්, රාජ්‍ය අමාත්‍යාංශයට මහාභාණ්ඩාගාරයෙන් නොලැබීම හේතුවෙන් එම අතිකාල දීමනා ගෙවීමට මුදල් රාජ්‍ය අමාත්‍යාංශය වෙත ලබා දුනි. රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් තුමා විසින් ඒ සඳහා ආවරණ අනුමැතිය පසුව ලබා දෙන ලදි. රාජ්‍ය අමාත්‍යාංශය මඟින් එම මුදල් නැවත ප්‍රතිපූර්ණය කරන ලදි.විගණනයේ නිර්දේශය පරිදි අමාත්‍යාංශය වෙත ලබාදුන් භාණ්ඩ 30 සහ Smart interactive whiteboard screen එක අමාත්‍යාංශයේ පරිහරණය සඳහා ලබාදීම පිළිබඳව කළමනාකරණ මණ්ඩලය දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු සූදානම් කරමි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කලයුතු වුවද, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන දින 270 ක් ප්‍රමාද වී එනම් 2022 නොවැම්බර් 25 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. | 2022 වර්ෂයේ මූල්‍ය වාර්තා නියමිත දිනට විගණනය සඳහා ඉදිරිපත් කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබිනි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 4.2 සංයුක්ත සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 ඡේදය ප්‍රකාරව මුදල් වර්ෂය ආරම්භවීමට දින 15 කට පෙර ඉදිරි වර්ෂ 3 සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිත යාවත්කාලීන කරන ලද සංයුක්ත සැලැස්මේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි. | 2022 – 2025 කාලපරිච්ඡේද සඳහා වූ සංයුක්ත සැලැස්ම විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |